# 2021ඔක්තෝම්බර් මස 07 වන දින පෙරවරු 9.30 ට මොරටුව මහා නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මොරටුව මහා නගර සභාවේ 2021ඔක්තෝම්බර් මස මාසික සභා රැස්වීමේ වාර්තාව

**සහභාගීත්වය:-**

| | | | |
|---|---|---|---|
| 01. | නගරාධිපති | - | ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 02. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 05. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 06. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 07. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 08. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා |
| 09. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ලලිත් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.කේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එෆ්.බී.නිලංක සිල්වා මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කුමාර රාජරත්න මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.පිලිප් ෆැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.උජිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.දීපා චාන්දනී ආරියවංශ මහත්මිය |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.මැක්සි ජේ ප්‍රනාන්දු මහතා |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | සුනිල් නන්දසිරි මාසකෝරාල මහතා |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා |
| 29. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 30. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා |
| 31. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 32. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය |
| 33. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 34. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා |
| 35. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුදර්ශනි ප්‍රියන්ත්‍රිකා කුරේ මහත්මිය |
| 36. | මහා නගර සභා මන්ත්‍රී | - | මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 37. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |

38. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
39. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය
40. මහා නගර සභා මන්ත්‍රී - ආර්.ක්‍රිෂනි ප්‍රනාන්දු මහත්මිය
41. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා
42. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය
43. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
44. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා

සහ

නාගරික ලේකම් (වැ.බ.) - එම්.කේ.ඩී.තාරක මුණසිංහ මහතා

ගරු නගරාධිපතිතුමාගේ ආරාධනය මත වැඩ බලන නාගරික ලේකම් එම්.කේ.ඩී.තාරක මුණසිංහ මහතා විසින් 2021.10.07 වන දින මාසික සභා රැස්වීමේ නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදි.

## 01. වාර්තාව පිළිගැනීම හා සළකා බැලීම.

2021.09.16 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව.

**මහ නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා**

ගරු නගරාධිපතිතුමනි, 2021.09.16 දින සභා රැස්විම් වාර්තාව පිළිගත යුතු යැයි මා යෝජනා කර සිටිනවා.

මහා නගර සභා මන්ත්‍රී ජී.එම්.සුරංග ජීන් අපොන්සු මහතා විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව 2021.09.16 දින පැවති මහ සභා වාර්තාව සභා සම්මත විය.

## 02. ගරු නගරාධිපතිතුමාගේ නිවේදන

### 2 (1) නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා

ගරු මන්ත්‍රිවරුනි, ගරු මහ නගර සභා මන්ත්‍රි යූ.එල් සේනක දමයන්ත ද සිල්වා මහතා අද දිනයේ සභාවට නොපැමිනෙන බව දන්වා එවා තිබෙනවා.

### 2 (2) නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා

ගරු මන්ත්‍රිවරුනි, ගරු මහ නගර සභා මන්ත්‍රි එම්.කේ.පී සුසන්ත පෙරේරා මහතා හදිසි අසනීප තත්වය මත අද දින සභාවට නොපැමිනෙන බව දන්වා එවා තිබෙනවා.

### 2 (3) නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා

ගරු මන්ත්‍රිවරුනි, ගරු මහ නගර සභා මන්ත්‍රි ඩී.ඩබ්.ඩී.රන්දු නිරෝෂණ මහතා අද දිනයේ සභාවට නොපැමිනෙන බව දන්වා එවා තිබෙනවා.

## 03. සභාව අමතා එවන ලද ආයාචනා පෙත්සම් පැමිණිලි හා සන්දේශ සභාව හමුවේ තැබීම.

### 03(1) මහ නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා

ගරු නගරාධිපතිතුමනි, දැනට වසරකට පමණ ඉහත දි මා විසින් සභාවට ඉදිරිපත් කලා උස්වත්ත, මුරවත්ත ගම් මුහුදු ඛාදනයට ලක්වෙලා වෙනවා කියලා. මුහුදු ඛාදනය නිසා නිවාස 20 ක් පමණ විනාශයට පත් වුනා. ඒ විනාශ වීම සම්බන්ධව ප්‍රදේශවාසින් පෙත්සමක් අත්සන් කරලා ගරු අගමැතිතුමාට, පවතින රජයේ අදාල නිලධාරින්ට ලබා දුන්නා. මීට ඉහත දි එක්සත් ජාතික පක්ෂයේ මොරටුව නියෝජනය කරපු හිටපු අමාත්‍ය ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමා කිව්වා මේ පාර ඡන්දය දෙන්න එතකොට හදලා දෙන්නම් කියලා නමුත් එක නාම මාත්‍රයක් පමණයි ඉටු වුනේ නැහැ. නමුත් මම අගමැතිතුමා හමුවෙලා පුද්ගලිකව ඉල්ලීමක් කලා ජයග්‍රහණයෙන් පසුව ගල් වැටිය සකස් කරලා දෙන්න කියලා. එම නිසා මේ වෙනකොට ඔබතුමාගේ දායකත්වයෙන් ඒ අවස්ථාව අපට උදාවෙලා තියෙනවා. මම ගරු අගමැති මහින්ද රාජපක්ෂ මැතිතුමාට ස්තුතිවන්ත වෙනවා.නමුත් ගරු නගරාධිපතිතුමනි මේ ගල්වැටිය දැමීම ක්‍රමවත්ව සිදු වෙන්නේ නැහැ. එම නිසා ඔබතුමා මැදිහත් වෙලා ඉදිරි වැඩසටහන ඉටු කර දෙන්න කියලා ඉල්ලා සිටිනවා. ජනතාව ඉල්ලීම් කලා මම ගමේ මන්ත්‍රීවරයා නිසා වෙන වෙන අය ලකුණු දාගත්තට ගරු නගරාධිපතිතුමනි, මේක අපි ආණ්ඩුව හැටියට අපේ දෙයක් මෙය ඉටුකර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

### 03(2) මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා

ගරු නගරාධිපතිතුමා, ලිපියක් ඉදිරිපත් කලා තියෙනවා එම්.කේ.අයි. ප්‍රනාන්දු නො 129/1 ලක්ෂපති පාර මොරටුව පදිංචි ඒ මහතා විසින් ලක්ෂපතිය පාරේ නාම පුවරු සිවිකර දෙන ලෙස කර ඇති ඉල්ලීම මා ඉදිරිපත් කරනවා.

### 03(3) මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා

ගරු නගරාධිපතිතුමා, මේ වාර්ෂාවත් සමඟ කල්දමුල්ල ප්‍රදේශයේ ඇති ඇළ මාර්ගය මෝදර කලපුව හරහා ගමන් කරන විටින් විට හිර විම නිසා නිවාස යටවන තත්වයට පත් වෙලා තියෙනවා. විශේෂයෙන් 4 වන පටුමග 5 වන පටුමග ප්‍රදේශවල ජීවත් වන ජනතාවට ඉතා සුලු වර්ෂාවකදි පවා ඇල මාර්ගය හිරවිමෙන් නිවාස යටවන තත්වයට පත්වෙලා තියෙනවා මේ සඳහා පිලියමක් යෙදන මෙන් ජනතාව දිගින් දිගටම ඉල්ලා සිටිනවා.

**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රිතුමා, මෝයකට සම්බන්ධව තාක්ෂණ වාර්තාවක් අනුව කටයුතු කරන්නට පෙරේදා දිනයේදි කටයුතු කලා අද දිනයේදි සම්පූර්ණයෙන්ම ඒ සියලු කටයුතු ඉටු වෙනවා.

**03(4) මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා**

ගරු නගරාධිපතිතුමා, බොහොම ස්තුතියි. අපි ඉල්ලා සිටින්නේ ඒ කටයුත්ත ඉක්මනින් ඉටු කරන්න කියලා. ඒවගේම සොයිසාපුර ක්‍රීඩාංගනය සම්බන්ධව දැනුවත් කිරිමක් ඉල්ලීමක් කරන්න තියෙනවා. ක්‍රීඩාංගනවල තණකොළ කැපිම් ඒ කටයුතු ආරම්භ කරලා තියෙනවා සොයිසාපුර ක්‍රීඩාංගනයේ තණකොළ කැපීම් කටයුතු කර දෙන මෙන් ඉල්ලා සිටිනවා.

**03(5) මහ නගර සභා මන්ත්‍රී - ඒ.ඒච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා**

ගරු නගරාධිපතිතුමා, පහුගිය සභාවේදිත් මේ කාරණාව සම්බන්ධව පොළ භූමිය සම්බන්ධව මතු වුන නිසා ඒ ප්‍රශ්නයට අදාල පිලිතුර ලැබි තිබෙනවා පෙරේදා ඒ කසල ඉවත් කර තිබෙනවා. වෙළඳ මහතුන් ඒ හිඟ මුදල් ගෙවලා තියෙනවා. නමුත් අපි විශේෂයෙන් මතු කරන්න ඕන ගරු නගරාධිපතිතුමනි මාස කීපයක් තිස්සේ මතුවුන ප්‍රශ්ණයක් සමුපකාර සමිතියත් මහ නගර සභාවත් අතර තිබුන අන්නොන්‍ය අවබෝධය දූර්වලකම නිසා විපාක විදින්න සිදු වුනේ අවට සිටින ජනතාවට. අපි ඉල්ලා සිටිනවා මෙවැනි තත්වයකට නැවත මතු නොවන අන්දමට හේතුව තමයි මේ පාලනය තියෙන්නේ ඔබතුමාගේ අතේ. මේ සම්බන්ධව සාකච්ඡා කරලා මුදල් වෙලාවට ලබාගෙන ඒවා අය කරලා නැවතත් මේ කසල ගොඩ ගැහෙන්න ඉඩ නොදි විධිමත් ලෙස ඉටු කරන ලෙසත්, ඒ අයගේ බදු මුදල් අය කර ගන්න ගමන් සාපේක්ෂව ඒ අයට සාධාරණ සේවයක් ඉටු කරන ලෙසත් ඉල්ලා සිටිනවා. එහෙම නැති වුනොත් නැවත මොරටුව පුරාවට කුණු ගොඩවල් ගැහීමෙන් සභාවටත් ප්‍රශ්ණයක් බවට පත් වෙනවා ජනතාවගේත් සෞඛ්‍ය ගැටලුවක් බවට පත් වෙනවා.

**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමා, විශේෂයෙන්ම මොල්පේ පොල සමුපකාර සමිතිය අද රටේ සමහර ආයතන සතුව තිබෙන්නාවූ ඔවුන්ගේ අධිකාරිමය බලය යටතේ තියෙන්නාවූ යම් යම් දේවල් සභාව සතු ක්‍රියාමාර්ග ගැනිමේදි ඒ අධිකාරියට අයත් වෙන්නාවූ භූමියන් තුල තිබෙන්නාවූ දේපල වලට කටයුතු කිරිමක් කරන්න සභාවට පුලුවන් කමක් නැහැ. සභාවට එහෙම පුලුවන් කමක් ඇති කර ගන්න කටයුතු කර ගැනිමට පුලුවන්කමකුත් නැහැ. අපිට පුලුවන් වෙන්නේ යම් කිසි ආයතනයටක යම්කිසි නිලධාරියෙකුට කටයුතු කිරිම පමණයි. පෙරේදා මේ මුදල් ගෙවිමේදි සම්පූර්ණයෙන්ම මම ප්‍රධාන සෞඛ්‍ය පරික්ෂක මහතාට දෝෂාරෝපණය කලා වෙළඳ පොලකින් ගෙවන මුදල් ලබා ගැනිමේ සභාවට ගැනිමට කටයුත්තක් නොවෙයි සමුපකාරය විසින් වෙලෙන්දන්ගේන් මුදල් වලින් පොල පවත්වාගෙන යනවා නම් සමුපකාරය විසින් ඔය තිබෙන කුණු වලට අදාල වෙන්නාවූ විසදුම දියයුතුයි. ඒ ඇරෙන්නට අපිට පුලුවන් කමක් නැහැ. මොකද හේතුව ඒය අපේ වගකිමක් නොවෙයි. අපිට වරිපනම් මුදල් ගෙවන්නෙත් නැහැ ,බදු මුදලක් ගෙවන්නෙත් නැහැ ඒ නිසා ලොකු වරදක් කරලා තියෙනවා. එක දවසක් නොවෙයි මගේ මේ අවුරුදු 16 ඇතුලත 30 ස් 40 ස් වතාවක් විතර කරලා තියෙනවා. කුණු ගොඩක් තියලා ඒකෙන් අයුතු ප්‍රයෝජන ගන්නවා. කසල තියනකොට නගර සභාවේ ඩියුටියක් බවට පත් වෙලා තියෙනවා.මේවා එහෙම විසඳන්න පුලුවන් ඒවා නොවෙයි. මේවා විසඳන ක්‍රමවේදයක් තියෙනවා. කුණු ගොඩවල් 300ක් විතර තිබිලා මේ තත්වයට ගෙනල්ලා තියෙනවා. ඒ නිසා අපිට පුලුවන් කමක් නැහැ. ඒතන සිටින සමුපකාරයට වගකියන වෙළෙඳුන්ගෙන් අපිට වගකියන්න බැහැ වෙළඳුන්ට. අපි ගනුදෙනු කරන්නේ සමුපකාරයත් සමඟ විතරයි. සමුපකාරය ඔවුන සමඟ කටයුතු

කරලා විධිමත්ව කසල කළමනාකරණය කරලා දැන් අපේත් සිටිනවා ව්‍යාපාරික බදු කසල බදු කියන ඔක්කොම බදු ගෙවලාකටයුතු කරන අය. ඒහෙම අයත් එක්ක ගනුදෙනු කිරීම අපිට පුලුවන්කමක් නැහැ. තමන්ගේ සභාවේ ගෞරවයත් ආරක්ෂා කරගෙන සභාවේ කටයුතු කරන ආකාරයට කටයුතු කරන ඒක හොඳයි කියන ඒක තමයි මගේ විශ්වාසය. ඒම නිසා සහයෝගයෙන් මේ කටයුත්ත කරන්නට ඕනෑ. මින් ඉදිරියට මේ කටයුතු කරද්දි සම්පූර්ණයෙන්ම වගකීම් විරහිතව නැතිව වගකීම් සහිතව මේ කටයුතු කරන්නට වෙනවා.

**03(6) <u>මහ නගර සභා මන්ත්‍රී - ඒම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, ලිඛිත පැමිණිල්ලක් සහ වාචික පැමිණිල්ලක් තිබෙනවා.කඩලාන ශාන්ත අන්තෝනි දෙව්මැදුර ප්‍රධාන දොරටුව ඉදිරිපිට දෙවට පාරේ පදිංචි පිරිසක් විසින් ඉදිවෙන ගොඩනැගිල්ල සම්බන්ධව පරික්ෂන සිදු කරන ලෙස ඉල්ලා සිටිනවා.සැලසුම් අනුමැතිය මොරටුව මහ නගර සභාව විසින් ලබාදි ඇතැයි මා හට දැන ගන්නට ලැබී ඇති බැවින් මේ සම්බන්ධව සාධාරණ පරික්ෂණයක් පවත්වන බව දන්වා සිටිමි.

**03(7) <u>මහ නගර සභා මන්ත්‍රී - ඒම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, කඩලාන ඩික්සන් පීරිස් ක්‍රීඩාංගනය මේ වෙනකොට නඩත්තු කටයුතු සිදු වෙන්නේ නැහැ වල් බිහි වෙලා රාත්‍රිකාලයේ විශමාචාර කටයුතු සිදුවෙනවා සියලු දෙනාටම දැක ගැනිමට හැකිවෙලා තියෙනවා. මම දැක්කා ක්‍රීඩා කමිටු වාර්තාවේ අනිකුත් ක්‍රීඩාංගන වලට යම්කිසි ඇස්තමේන්තු ඒ වගේම සංවර්ධන කටයුතු කරන්න වෙන් කරලා තියෙනවා.මම ඔබතුමාගෙන් මේ ක්‍රීඩාංගනය සම්බන්ධයෙනුත් සැලකිල්ලක් දක්වලා මේ නඩත්තු කටයුතු සිදු කර දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(8) <u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, පෙත්සම් පැමිණිලි අයිතමය යටතේ පැමිණිලි දෙකක් ඔබතුමන්ට ඉදිරිපත් කරනවා. මේ පැමිණිලි දෙක ගරු නගරාධිපතිතුමනි විශේෂයෙන් ගරු ආණ්ඩුකාරතුමාට, ඒවගේම පලාත් පාලන අමාත්‍යතුමාට, ඒවගේම බස්නාහිර පලාත් සභාවේ කොමසාරිස්තුමාට ඉදිරිපත් කිරිමට බලාපොරොත්තු වෙනවා.ඒ කවරක්වත් නිසා නොවෙයි ගරු නගරාධිපතිතුමනි පලාත් පාලන ආයතන ප්‍රධානීන්ට ඒ වගේම පලාත් පාලන ආයතන සභිකයින්ට ආචාර ධර්ම පද්ධතියක් 1991 රජයේ අමාත්‍ය මණ්ඩල අධිකාරිය යටතේ ඉදිරිපත් කරනවා. ඒ නිසා අපි කවුරුත් අපේ ධූරයන් මේ ආචාර ධර්ම පද්ධතියට අනුකූලව පවත්වාගත යුතුයි. ගරු නගරාධිපතිතුමනි ආචාර ධර්ම පද්ධතියේ 6 වන පිටුවේ ආ යටතේ මෙහෙම කියනවා. පලාත් පාලන සභිකවරුන් හැම අවස්ථාවකදිම හැසිරිය යුත්තේ ජනතාවගේ නියෝජිතයන් වයෙන් මහ ජනතාවට දකින්නට හැකි ඔවුන්ගේ ප්‍රතිරූපය සුරකෙන ආකාරයටයි. ගරු නගරාධිපතිතුමනි මේ ආයතනයේ පහලම සේවකයත්මේ ආයතනයේ කොමසාරිස්තුමාත් ඒ හැම දෙනාම අපට සමානයි. ඒ හැම දෙනාටම අපේ ගෞරවයක් තියෙනවා. ඒ හැම දෙනාම ආරක්ෂා කරන්න අපි බැඳිලා ඉන්නවා. මේ ආයතනයේ කිසියම් වූ පුද්ගලයෙක් විශේෂයෙන් මන්ත්‍රීවරු මේකේ බරපතල කම තව තීව්‍ර වෙන්නේ මේ ආයතන, නීතිය පරිපාලනය ස්ථාවර කාරක සභාවේ සභාපති වරයාගේම අතිශා බරපතල වැඩ. ගරු නගරාධිපතිතුමනි ඔබත් මමත් අපි පක්ෂ විදියට බෙදිලා ඉන්න නියෝජිතයො. මේ ආයතනය පවත්වාගෙන යාමේදි අපිට වාද විවාද මත ගැටුම් තිබෙනවා. හැබැයි ඒවැනි මේ ආයතනයේ ගෞරවය රකින්න, මේ මහජන නියෝජිතයින්ගේ ගෞරවය

රකින්න මේ සුජාත දූ-පුතුන්ගේ ගෞරවය කවුරු හරි කෙලෙසනවා නම් වහාම අපි ඊට මැදිහත් වෙන්න ඕන. මම මේ කියන්නේ මේ ආයතනයේ සේවිකාවක් වන චතුරි මධුශානි ට දිගින් දිගටම සිදු වුන අඩඩතේට්ටම්, දිගින් දිගටම තර්ජන, ජීවිත බලබෑම් ඒ විතරක් නොවෙයි මේ මන්ත්‍රීවරයාගේ හැසිරීම් අතිශා ඛේදජනක තත්වයට පත්වෙලා තිබෙනවා බොහෙම කල් ඉවසුවා. බොහොම කල් මම බලාගෙන හිටියා අපිට දේශපාලන වෙනස්කමක් නැහැ.

අපි කවුරුත් මේ රටේ තත්වයන් ඇතුලේ බැදිලා ඉන්නවා කාන්තාවන්ගේ අයිතින් ආරක්ෂා කරන්න. මේ ආයතනයේ සේවිකාවන්ගේ අයිතින් රකින්න. මේ ආයතනයේ ගෞරවය, මේ සභාවේ ගෞරවය රකින්න අපි කවුරුත් බැදිලා ඉන්නවා. ඒය තුට්ටුවකට මායිම් නොකර ආයතනය තමන්ගේ, පරිපාලනය තමන්ගේ, නීතිය තමන්ගේ, තමන්ට කැමති විදියට වැඩකටයුතු යමෙක් කරයි නම් මොකක්ද කරන්න ඔන මම මගේ වගකිම කරන්නේ මේ හැමදෙනාමවෙනුනේ මේ ඉතිහාසයේ අවුරුදු 25 ක ඉදලා කවර කවදාවකවත් මේ වගේ චෝදනාවක් මගේ මැදිහත්විමෙන් සිද්ද කරලා නැහැ. නමුත් මේ සේවා ස්ථානයේ සේවා කටයුතු වලට බාධාවක් සිදු වන්නේ නම් අන්න අපට අදාල වෙනවා. අද කරන වැරදි වැඩේ බලහත්කාරකමින් ගරු නගරාධිපතිතුමනි අපි මහජන නියෝජිතයෝද. මේ තත්වයෙන් මේ ආයතනයේ , කොමසාරිස්තුමා දන්නවා, ලේකම්තුමා දන්නවා මේ සේවිකාව අවුරුදු 9 යි තැන් 8 කට මාරු කලා.මොකක්ද මේ කරන්නේ. කොහොමද මේක කරන්නේ ඒහෙම කරන්න බැහැ ඔයගොල්ලො ඔයගොල්ලන්ගේ වැඩ ඒලියට ගිහිල්ලා කරන වැඩ කථා කරන්නේ නැහැ. හැබැයි මහජන නියෝජිතයෙක් හැටියට වගකිව යුතු සභාපතිවරයෙක් ඒසේ කරන්නෙ නම් කැක්කුමක් නැද්ද අපට. අද හදවත පතුලක තියෙන වේදනවා මේ පිටවෙන්නේ. ඒහෙම කරන්න ඒපා. මොරටුව ජනතාවගේ ගෞරවය කෙලසන්න ඒපා. මහජන නියෝජිතයන් කෙරේ තියෙන විශ්වාසය නැති කරන්න ඒපා.හැබැයි තාමත් මොරටුව ජනතාව මේ ආයතනය විශ්වාස කරනවා. සමන්ලාල් තුන්වරක් නගරාධිපති වෙන්නේ ඒ විශ්වාසය නිසා. හැබැයි ගැහැනියෙකුට ඉන්න දෙන්නේ නැහැ මේකේ කියලා කියනවා නම්, ගරු නගරාධිපතිතුමනි මේක ඛේදවාචකයක් මම කිසි කෙනෙකුට පෞද්ගලිකව මෙහෙම කථා කරන්න හිතුවේ නැහැ අද මම ආණ්ඩුකාරවරයට මේක කියනවා. මගේ වගකිම මොකද ඔවුන් හදපු නීති මේ. ඔවුන් හදපු ආචාර ධර්ම . ඒ ආචාර ධර්ම නොසලකා කටයුතු කරන්නේ නම් කණගාටුයි ගරු නගරාධිපතිතුනි.මම කිව්වේ මම කොමසාරිස්තුමාගේ ටයි-කෝට් වලට නොවෙයි ගරු කරන්නේ.අර කුණු අදින සේවකයාගේ වැරහැලි වලට නොවෙයි ගරු කරන්නේ ඔබතමයි නායකයා මේ සේවකයන්ගේ. ඔබ තමයි මේ ලියුම් ගහන්නේ. හැබැයි ඔබ පුද්ගලිකව හදුනන්න ඕන. මොකක්ද මේ කර ගත්තේ කියලා අහන්න.ඔබේ හදවතට තට්ටු කරලා අහන්න ඔබ අමාරුවෙන් ලබා ගත්ත දැනුමෙන් ලබපු තනතුර. ඒ තනතුරෙන් රකින්න ඕනැ නායකත්වය මග පෙන්විම ඔබ ප්‍රධානියා එක එක මිනිස්සුන්ගේ උවමනාවන් වලට යට වෙන්න ඒපා කොමසාරිස්තුමනි. ගරු නගරාධිපතිතුමනි ඔබ ඉදිරිපත් වෙන්න දේශපාලන විරසක තියෙයි, දේශපාලන මතිමතාන්තර තියෙයි, ඔබේ පාලනයට ඒරෙහිව මගේ විවේචන තියෙයි හැබයි මේ ඒක නොවෙයි මෙතනද ඔබ හරියට කටයුතු කලේ නැත්නම් මොරටුව මහ නගර සභා සීමාව ඇතුලේ කාටද පුලුවන් ඒහෙම මේ ආයතනයේ සේවිකාවකට ඒහෙම චන්ඩිපාට් කම් දාන්න.බලහත්කාර කම් කරන්න. මේ තියෙන්නේ ඒ සේවිකාව ගල්කිස්ස පොලිසියට දාපු පැමිණිල්ල ඇසිඩ් ගහන්න හදුවා කියලා.ගරු නගරාධිපතිතුමනි, ඔබ මට වඩා හොඳින් දන්නවා කියලා මම විශ්වාස කරනවා. තවත් සේවකයන්ට තර්ජනය කරනවා. සමහර සේවකයෝ වැඩට ඒන්නේ නැහැ.

මම කියනවා ඔබේ ගෞරවය, මගේ ගෞරවය, මහජන නියෝජිතයින්ගේ ගෞරවය හැබැයි මම මොකක් අත්ඇරියත් මේ අවනඩුව අත්අරින්නේ නැහැ. මෙහි ඉතිහාසය මට මතකයි ගීතානි ලොකුවැල්ල මහත්මිය සම්බන්ධව මට පුද්ගලික සම්බන්ධතා නැහැ. ඇය ඉතාමත් කාර්යශුර සේවයක් කරපු නිලධාරිනියක්. වැරදි විදියට සේවය මාරු කිරිමේ වෙලාවේ තමයි ප්‍රශ්ණ ඇති වුනේ. ගරු නගරාධිපතිතුමනි, මේ ආයතනයේ සේවාව ආරක්ෂා, කර ගන්න වැඩ කරන අවංක සේවකයින් ඉන්නවා. මේ ආයතනයේ නගරාධිපතිවරයා ඔබ.මා මේ දෙස බලාගෙන හිටියා බොහෝ කල් නතර නොවන නිසා මේ කියන්නේ. මම දන්නවා අද ඔබේ පැත්ත ගත්තත් මහජන නියෝජිතයෝ තමන්ගේ හෘදසාක්ෂියට ඒකඟව මම දන්නවා අද මම මේ කියන ඒකට ඒකඟයි. අපි කවුරුත් ඒක හඬින් කියනවා මේ ආයනයේ වැඩ කරන හැම කෙනෙකුටම ආරක්ෂාව තියෙන්න ඕනැ. ඒ ආරක්ෂාව නැති කරන්න ඒපා. තමන්ගේ තියෙන පුද්ගලික ප්‍රශ්ණ විසඳ ගන්න. හැබැයි මේ ආයතනයේ පරිපාලනයට බාධා කරන්න එපා කියන ඉල්ලිම මම කරනවා.

## 03(9) <u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මගේ ඊලඟ පැමිණිල්ල චතුරි මධුශානිට නියෝජ්‍ය නාගරික කොමසාරිස් තුමා ලිපියක් යවනවා 2021.5.17 ඉංජිනේරු දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවය කරන ඔබ විනය හේතු මත වහාම ක්‍රියත්මක වන පරිදි ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරනු ලැබේ. මේ විනය පරික්ෂණය තියන්න කලින් ඇය ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා හමුවෙලා අහනවා මම මොනවද කරන්න ඔන කියලා ඒයා කියනවා වැසිකිලි හෝදන්න. අතුගාන්න. ඇය අවුරුදු 9ට ස්ථාන 8 ක සේවය කරනවා. ඒ විනය හේතුන් නිසා නොවෙයි. සේවා අවශ්‍යතාවයන්. ඇයි මේ දැන් විනය පරික්ෂණය. මම සොයා බැලුවා ඇය වරදක් කරලා තියෙනවා නම් කියන්න. ඒහෙම වරදක් පිලිබඳව විනය පරික්ෂණයක් නැහැ. ඇය උපනගරාධිපති කාර්යාලයට දාන්නේ කොමසාරිස්තුමා. මෙය ඉතා හොඳට පැහැදිලියි කොමසාරිස් තුමනි මම ඒදා කිවුවා සභාවේ මේවා කථා කරන්න ඉඩ තියන්නත් ඒපා.සේවකයෙක් වරදක් කරනවානම් විනය පරික්ෂණයක් කරන්න මම 100% ක් ඒකඟයි. ගරු නගරාධිපතිතුමනි මේ විනය පරික්ෂණයට හේතු සොයා බැලුවම කොවිඩ් කාලයේ මේ ආයතනයේ සේවය අත්‍යාවශ්‍ය සේවයක් වශයෙන් පවත්වාගෙන යද්දි, යම් සේවකයන් ප්‍රමාණයක් ගෙන්න ගත්තා. ඒන්න අපහසු නිසා අපි ප්‍රවාශන පහසුකම් දුන්නා. යම් දිනක් ඇයට සේවයට ඒන්න බයිසිකලය කැඩිලා හදාගන්න ක්‍රමයක් නැති නිසා ඒන්න බැහැ කියලා තමන්ගේ ජංගම දුරකථනය හරහා මැසේජ් ඒකක් දැම්මා ප්‍රවාහන පහසුකම් දෙනවා නම් ඒන්නම් කියලා. ඔය මැසේජ් ඒක තමයි හේතුව විනය පරික්ෂණයට. කොමසාරිස්තුමා මේගොල්ලන්ගේ මීට පෙර සේවා කාලය හොඳින් සැලකුවා නම් අවවාදයකින් වෙනස් කරන්න තිබුන තත්වයක්. විනය පරික්ෂණ වල පලවෙනි ඒක තමයි අවවාදය.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු නිශාන්ත මන්ත්‍රිතුමා,ඔබතුමා මේක ඩිබෙට් ඒකක් වගේ දිගටම යනවා.පෙත්සමක් ඉදිරිපත් කරනවා නොවෙයි. පෙත්සමක් ඉදිරිපත් කරනවා නම් සභාවේ ප්‍රමාණය ඔබතුමා දන්නවා නේ.

<u>**මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, පෙත්සමක් නොවෙයි පැමිණිල්ලක්. ඔබතුමා මේකට කැමැත්තෙන් සම්බන්ධ වෙනවා නම් සම්බන්ධ වෙන්න. ඔබ සහ කොමසාරිස්තුමාගෙන් ඉල්ලනවා මෙවැනි අකටයුතුකම් කරන්න ඒපා. ඉන් අනතුරුව අනිත් සේවිකාවන් අද වෙනකොට යම් බයක් මේ සිද්ධිය ඔස්සේ ගොඩනැගී තියෙනවා. අපි මේ අරගලය ඇතුලේ කෙනෙක් නිශේධනය කරන්න නොවෙයි ගරු නගරාධිපතිතුමනි සභාව ඇතුලේ මේ අරගලය කරන්නේ කරුනාකරලා අපි මේ තත්වය වෙනස් කරමු.

<u>**මහ නගර සභා මන්ත්‍රී - ඩී.ඒම්.සුජිත් පුෂ්පකුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, ආයතන කමිටු සභාපතිගේ නම කියනවා ඇහුනා. අපි අවුරුදු 15 ක් මේ නගර සභාවට ඇවිල්ලා. ඒ අවුරුදු 15 තුල අපි දැකලා තියෙනදේ සම්බන්ධව කියන්න දේවල් තිබුනත් මේ අවස්ථාවේදි ඒවා කියන්න අදහස් කරන්නේ නැහැ. හැබැයි මන්ත්‍රිවරයන්ගෙන් මන්ත්‍රිවරියන්ට වන අඩත්තේට්ම් තියෙනවා. මේ සම්බන්ධයෙන් ආයතන කමිටු සභාපති වරයාගේ ගෞරවය සම්බන්ධයෙන් යම්කිසි ප්‍රශ්ණයක් තියෙනවා. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා ඔබතුමාගෙන් සභාවේ කියපු සියලු කරුණූ සම්බන්ධයෙන් පරික්ෂනයක් කරන්න. ඒ පරික්ෂනයේදි අදාල සේවිකාව විසින් නම් මේ කතා කිරිමට පෙලඹුවේ ඒ සම්බන්ධව විනය ක්‍රියාමාර්ග ගන්න. මට පෞද්ගලික මන්ත්‍රී වරප්‍රසාද සම්බන්ධව මට වෙච්ච හානිය සම්බන්ධව මේ සභාව තුල සිදුවුන ඒ ප්‍රකාශය මගේ පෞද්ගලිකත්වයට මගේ ගෞරවයට යම් හානියක් සිදුවුනා. ඒ සම්බන්ධ පරික්ෂණයක් තියලා මම වැරදි නම් ඕනෑම දඩුවමක් විදින්න සුදානම්. කොමසාරිස්තුමාටත් කියනවා අදාල විනිවිදභාවයෙන් යුතු පරික්ෂණයක් පවත්වන්න. ආයතන කමිටු සභාපති වරයා විදියට කිසිම දෙයක් නොදැන ඒ ප්‍රකාශය කරපු කෙනා පිලිබදව අපි කණගාටු වෙනවා. විනය හේතුන් මත යම් කිසි කෙනෙක් සම්බන්ධව විනය පරිපාටියේ 26 ඒ වගන්තිය 28(3) මුලික විමර්ශනයක් ආරම්භ කිරිමට පෙරාතුව හෝ මුලික විමර්ෂනයක් පවත්වාගෙන යන අතරතුර ඇති කරුණූ මත හෝ උද්ගතව ඇති තත්වයන් මත හෝ කිසියම් නිලධාරියකු තවදුරටත් ඔහුගේ තනතුරේ හෝ අදාල සේවා ස්ථානයේ හෝ සේවයේ යෙදි සිටිනවානම් මුලික විමර්ෂනයේදි බාධාවක් විය හැකි යැයි අදහස් කරන විටක ඒම සේවකයාව විනය හේතුන් මත ස්ථාන මාරුවීම් කර විනය පරික්ෂනය කල හැක. මේවා තියෙන්නේ ගෙවල් වලට ගිහිල්ලා මිනිස්සුන්ගේ අයිඩින්ඩි කාඩ් උස්සපු අයගේ නීති පොත් වල නොවෙයි. මිනිස්සුන්ව උස්සලා සතනය කරපු අයගේ නීති පොත් වල නොවෙයි.

<u>**මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, මට රීති ප්‍රශ්ණයක් තියෙනවා. ආයතන කමිටු සභාපතිතුමා හොඳටම දන්නවා මේ අයිතමය යටතේ මම පැමිණිලි දෙකක් ඉදිරිපත් කලා. ඒවට එහෙම පිලිතුරු දෙන්න බැහැ. තමන්ට පැමිණිල්ලක් තිබෙනවා නම් ඒක කරන්න පුලුවන්.

<u>**මහ නගර සභා මන්ත්‍රී - ඩී.ඒම්.සුජිත් පුෂ්පකුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, උත්තර දෙන්න බැහැ ඒක මම දන්නවා. හැබැයි මෙතන මන්ත්‍රිවරයෙකුගේ නමක් කිව්වට පස්සේ ආයතන කමිටු සභාපති මන්ත්‍රිවරප්‍රසාද යටතේ මට ඒ ප්‍රකාශය කිරිමේ බලය අයිතිය තියෙනවා. හේතුව මගේ නම කියනනේ නැතුව නිශාන්ත මන්ත්‍රිතුමා පැය ගානක්

කථා කරත් මට ප්‍රශ්ණයක් නැහැ.ඒ නිසා මම කියන්නේ නම කීම සම්බන්ධයෙන් විදිමත් පරික්ෂණයක් පවත්වන්න කියලා. ගරු නගරාධිපතිතුමනි, කොමසාරිස්තුමාට නියෝග කරන්න කියලා ඉල්ලා සිටිනවා. හේතුව මේක කුමන්ත්‍රනකාරි විදියටකෙනෙක්ගේ චරිතය ඝාතනය කිරිම සඳහා ගත්ත ප්‍රයත්නයක් හැටියට අපි දකින්නේ. ඒ නිසා අනුන්ගේ දේපල විනාශ කරපු අය අවුරුදු ගණනාවක් වෙනවා මේ සේවකයෙක් ගැන මේ විදියට කථා කලාද? මම සතුටු වෙනවා ඒ සේවිකාවගෙන් හරි යම්කිසි සේවකයෙක් වෙනුවෙන් මෙතන කථා කිරිම ලොකු දෙයක්. ඒ නිසා මම ඉල්ලිමක් කරනවා ගරු නගරාධිපතිතුමනි මේ සම්බන්ධව විශේෂ පරික්ෂණයක් පවත්වන්න කියලා.

**03(7) <u>නියෝජ්‍ය නගරාධිපති - ඩී.සමන්ත සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, ඉල්ලීමක් කරනවා විෂබීජ හරණය කිරිමට සැනිටයිසර් ලබාදෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(8) <u>මහ නගර සභා මන්ත්‍රී - ඒම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, මේ දිනවල ඉතාම සීඝ්‍රයෙන් ඩෙංගු රෝගය ව්‍යාප්ත වෙමින් පවතිනවා.දැනටමත් රෝගීන් ප්‍රමාණයක් වාර්තා වෙලා තියෙනවා. එම නිසා දූම්මානය කිරිම කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු නගරාධිපතිතුමා, මම ඊයේ රාවතාවත්ත සුසාන භූමියට ගියා. ඒහි ඉතා විශාල ලෙස තණකොල වැවිලා තියෙනවා. විශාල ලෙස මදුරුවෝ බෝවෙලා ඒතන ඉන්න බැරි තත්වයටම.එම නිසා ඒ සම්බන්ධව අවධානය යොමු කරලා ඉක්මනින් අවශ්‍ය කටයුතු කරදෙන මෙන් ඉල්ලා සිටිනවා.

**03(9) <u>මහ නගර සභා මන්ත්‍රී - රවිනාත් ජේ ගුණසේකර මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, දුරකථන නාමාවලිය යාවත්කාලින කර සියලු මන්ත්‍රීවරුන් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - රවිනාත් ජේ ගුණසේකර මහතා</u>**

ගරු නගරාධිපතිතුමා,දෙවන ඒක තමයි සිටිනෙට් ආයතනය සම්බන්ධව ගරු නගරාධිපතිතුමනි, මම මෙයට සම්බන්ධ වුනේ ඔබතුමා මට කිව්වා සියලුම ජත්‍යාන්තර සම්බන්ධතා පිළිබඳව කටයුතු කරන ලෙස, අපි 2003 වර්ෂයේ සිටිනෙට් ආයතනය සමඟ කටයුතු කලා. අපට ආධාර ලබා දුන්නා. ඒ අනුව මෙයට අදාල සාමාජික මුදල් ගෙවලා සාමාජිකත්වය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු රවිනාත් ගුණසේකර මැතිතුමා ඉදිරිපත් කරන කාරණය අපි සභාවක් විදියට සලකා බලා හේතුව 2006 අපි සභාව භාරගන්නා වෙලා සිටිනෙට් ආයතනයෙන් අපිට ලබාදිපු ආධාර මුදල් වලින් අපි කටයුතු කලා. ඔබතුමා මේ සම්බන්ධිකරණය මේ විදියටම පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය කරන කටයුතු කරන්න.

**03(10)** **<u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේශ් ඉන්දික මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, රජය විසින් ක්‍රියාත්මක කරන මාර්ග ලක්ෂයක් කාපට් කරන වැඩසටහන යටතේ මම දන්නවා ඔබතුමාත් සැලකිය යුතු මාර්ග ප්‍රමාණයක් කාපට් කිරීම සඳහා බොරුපන ප්‍රදේශයේ ඉදිරිපත් කරලා තියෙනවා. ඒවගේම විමල් වීරවංශ ගරු අමාත්‍යතුමාගේ ප්‍රතිපාදන යටතේ ගරු නගරාධිපතිතුමනි මේ ඒක යෝජනාවක් විතරයි ක්‍රියාත්මක වුනේ. ඒ රෝහණපුර තෙලවල සහ මාලිගාව පාර යා කරන රෝහණපුර කාපට් කිරීම විතරයි සිදුවුනේ. දැනට මාස 8 කට කලින් සිදු වුන කරුණක්. මේ වෙනකොට මගේ දැනුමේ හැටියට. අත්‍යාවශ්‍යම පාරවල් අරගෙන මගේ කොට්ඨාශයේ පාරවල් දෙකක් තියෙනවා.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ යෝජනා කරලා ඉවරයි. දැනට කරලා නැත්තේ ලක්ෂපතිය ඇතුලු මෙතනින් ඒහාට මේ ඒකක් වත් කරලා නැහැ. ලක්ෂපතිය, ඉඩම, මොරටුවැල්ල 1,2 කොරලවැල්ල 1,2 කටුකුරුන්ද 1,2 දිගටම කරලම නැහැ.

**03(11)** **<u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.ඒච්.සුදේශ් ඉන්දික මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, පහුගිය කාල සීමාවේ කොවිඩ් වසංගත කාලයේ නිරෝධානය වන පවුල වලට රජය විසින් ලබා දෙන 2000/- දීමනාව සම්බන්ධව සෑහීමකට පත් වෙන්නේ නැහැ. පවුල් 200 කට පමන අඩු ආදායම් ලාභී ජීවනෝපාය අහිමි වු පවුල් සිටියා. ඒ පවුල් අසරණ වෙලා. මේක මට විතරක් නොවෙයි ගරු නගරාධිපතිතුමනි ප්‍රශ්ණ තියෙනවා. ඒ අසරණ තාවයට පත් වුනේ නගරාධිපතිතුමනි ග්‍රාමසේවක නෝනා වත්, ඩී ඕ. නෝනා වත් නෙවෙයි.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, අපි ඔය සම්බන්ධව කථා කරන්න ඕන තැන මෙතන නොවෙයි. සංවර්ධන කමිටු අවස්ථාවේදී කථා කරමු.

**<u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.ඒච්.සුදේශ් ඉන්දික මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඒ සම්බන්ධයෙන් අපි ඒකතු වෙලා ගන්න ඕන ක්‍රියාමාර්ග ගන්න ඕන. ප්‍රාදේශිය සංවර්ධන කමිටු හරහා ගරු නගරාධිපතිතුමනි මොකක් හෝ ඒ නිසා මෙවැනි දේවල් ඉදිරියේදි නොවෙන්න අපේ ගෞරවයත්, ආණ්ඩුවේ ගෞරවයත් රැකගෙන ඉදිරියට යන්න ඔබතුමා නායකත්වය අරගෙන කටයුතු කරයි කියලා බලාපොරොත්තු වෙනවා.

**03(12)** **<u>මහ නගර සභා මන්ත්‍රී - ශිරෝමි ඉන්දිකා කුරේමහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමා, මෝල්පේ පොළ භූමියෙහි කුණු ඉවත් කිරීම කළමණාකරණය කරන ලෙස ඉල්ලා සිටිනවා. ඔබතුමා කුණු සම්බන්ධයෙන් යම්කිසි ක්‍රමවේදයකට කරනවා කියලා තමයි ජනතාව කියන්නේ. මෝල්පේ පොළ අසල නැවත නැවත ඒම ස්ථානවලට වෙළඳුන් පමනක් නොවෙයි බාහිරින් කුණු ගෙනත් දානවා කියලා මට දුරකතන ඇමතුම් එනවා.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට මම පාඩමක් උගන්වනවා නොවෙයි. කමිටු සාමාජිකත්වය දරණ ගරු මන්ත්‍රීතුමියක් නේද? ගරු රවිනාත් ගුණසේකර මැතිතුමා සිටියදි අපි ඔතන ඉදලා එතුමාගෙන් කුණු දාන්න සල්ලි වැඩියෙන් ගන්නකොට අඩුවෙන් ගන්න විදිය අපි කල්පනා කලේ. මන්ත්‍රීවරයෙක් විදිහට සභාවේ ගෞරවය ආරක්ෂා කරගෙන සභාවේ කටයුතු මොනවද කියලා කරන දේවල් තමයි අපි කලේ. ඔබතුමිය මට කියන්න ඒපා ඒතන තියෙන කුණු කළමනාකරණය කරල ගන්න කියලා. මේක අපේ ආයනයක් නොවෙයි. ඔබතුමිය කථා කරලා කියන්න මේක නගර සභාවේ ඩියුටියක් නොවෙයි ඔයගොල්ලෝ කරන්න.

## 04. <u>ප්‍රශ්ණ</u> - නැත

## 05. <u>යෝජනා</u> -

**05(1)** නගරාධිපති ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා විසින් ඉදිරිපත් කර ඇති පහත සඳහන් යෝජනාව නගරාධිපතිඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි.

"1977 දී ස්ථාපිත කරන ලද මොරටුව මහා නගර සභාවේ පළමු මහා නගර සභාවේ සිට අඛණ්ඩව වසර 23 ක් මහා නගර සභා මන්ත්‍රී ධුරය දරමින් පක්ෂ භේදයකින් තොරව මොරටුව මහා නගර සභා බලප්‍රදේශයේ පුරවැසින්ගේ සමාජ, ආර්ථික, සංස්කෘතික, සුබසාධනය උදෙසා කටයුතු කල මොරටුව මහා නගර සභාවේ හිටපු විපක්ෂ නායක, පිලිප් ගාවින් මත්තෙස් මහතාගේ අනුපමේය සේවය සඳහා මෙම සභාවේ ගෞරවනීය උපහාරය පුදකර සිටින අතර, එතුමාගේ හදිසි අභාවය පිළිබඳව එතුමාගේ බිරිඳ ඇතුළු දූ-දරුවන් වෙත මෙම සභාවේ ශෝකය ප්‍රකාශ කළ යුතු යැයි යෝජනා කරන්නීය."

අද දින සභාව නියෝජනය කරන මහා නගර සභා මන්ත්‍රීවරුන් 43 දෙනෙකු යෝජනාව ස්ථිර කළේය.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීවරුනි, සියලු මන්ත්‍රීවරුන්, නිලධාරින් සඳහන් කර ගනිමින් විශේෂයෙන් දිර්ඝව කථා නොකලට යෝජනාව ඉදිරිපත් කරමින් මගේ ගෞරවනීය මන්ත්‍රීවරු සියලු දෙනාම මේ යෝජනාව ඉදිරිපත් කිරිමට ලොකු ඕනකමකින් හිටියා. ඒ සියලුම මන්ත්‍රීවරු ඉදිරිපත් කලා හා සමානයි කියලා විශ්වාසය තබා ගනිමින් මා යෝජනාව ඉදිරිපත් කළා.

විශේෂයෙන්ම පිලිප් ගාවින් මත්තෙස් ගරු මන්ත්‍රීතුමාව, මම හඳුනාගන්නේ 1997 වර්ෂයේදී. එම කාලයේ අපගේ පාලනයේදී මේ නගර සභාවේ විපක්ෂයේ ඉඳගත්ත ගරු මන්ත්‍රීවරයෙක් විදියට එතුමා කටයුතු කළා. එවකට හිටපු මන්ත්‍රීවරු අතර දැනට සභාව නියෝජනය කරන මන්ත්‍රීවරු වන සුරේෂ් ඉන්දික මහතාත්, විශේෂයෙන්ම නිශාන්ත ප්‍රදිනාන්දු මහතාත්, නාලිනී ප්‍රනාන්දු මහත්මියත් යන අය හොඳින් දන්නවා. ඒ කාලයේ හඳුනාගත්ත පිලිප් ගාවින් ගරු මන්ත්‍රීතුමා මොනවිදියටවත් තමන් 2002 වර්ෂයේදී පාලකයන් බවට පත්වෙන අවස්ථාවේදීවත්, විපක්ෂ නායක බවට පත් වෙනතුරුම එතුමාගේ වෙනස්කමක් අපි දැක්කේ නැහැ. දැක්කා නම් දැක්කේ ගරු මන්ත්‍රීවරයෙකුට කරදරයක් වුණාම ඒ කරදරයේදී දෙමවුපියෝ සහෝදරයෝ පිහිට වෙනවා

වගේම පිහිට වෙන එකයි. එතරම් මිත්‍රශීලි මන්ත්‍රීවරයෙක්. එතුමාගේ වියෝව වෙනුවෙන් මාගේත්, මාගේ සහෝදර සියලුම මහා නගර සභා මන්ත්‍රීවරුන්ගේත් ශෝකය මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටිනවා.

**මහා නගර සභා මන්ත්‍රී - සුනිල් නන්දසිරි මාසකෝරාළ මහතා**

ගරු නගරාධිපතිතුමනි, එක්සත් ජාතික පක්ෂය නියෝජනය කළ පී. ගාවින් මත්තෙස් ශ්‍රේෂ්ඨ මන්ත්‍රීතුමාගේ අභාවය පිළිබඳව ශෝකය පළ කරන මේ අවස්ථාවේදී මට අතීතයේ සියලු මතක ආවර්ජනය වෙනවා. මගේ දරුවන් ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින අවස්ථාවේදී බෙහෙවින් උපකාර කළා. ඒ අවස්ථාවේදී රාත්‍රී 10 න් පසු ගෙදරට එන්න, මම ඒ කටයුතු කරලා දෙන්නම් කියලා කියනවා. පිරිත් කියලා බුදු ගුණ සිහි කරලා සියලු වතාවත් කරලා දරුවන්ට ආශිර්වාද කරනවා. බුදු පිළිම වහන්සේ නමක් ද ලබා දෙනවා. එක දවසක් මෙතුමාගේ නම පත්තරෙත් යනවා. දෙයියෝ සාක්කි වලට. රුපියල් විසි හත්දහසක පමණ ප්‍රමාණයක බුලත් විටි කාලා කියලා. එක්සත් ජාතික පාක්ෂිකයෙක් වන එතුමා පක්ෂය වෙනුවෙන් ජීවිත කාලය පුරාම විශාල සේවාවක් ඉටු කලා. ඒ පිළිබඳවත් මෙහිදී මතක් කල යුතුයි.මට තව මතක් වෙනවා සිරිපාදේට සණ්ටාරයක් පූජා කළා. අපිත් ගියා ඒ අවස්ථාවට. එවැනි පුණ්‍ය කර්ම කටයුතු සිය ජීවිතයේදී දායාද කළ එතුමාට ඒ පින් බලයෙන් අමා මහා නිවන අත්වේවා යැයි ප්‍රාර්ථනා කරනවා.

**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජීත් පුෂ්ප කුමාර මහතා**

ගරු නගරාධිපතිතුමනි, ජ්‍යෙෂ්ඨ මන්ත්‍රී ගාවින් මත්තෙස් මහතාගේ අභාවය වෙනුවෙන් ශෝකය පළ කරන මේ අවස්ථාවේදී, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවේගයත් එම පවුලේ උදවියට පළ කරනවා. එතුමා පක්ෂ පාට බේදයකින් තොරව කාටත් උදවු කරනවා. මට මතකයි මන්ත්‍රීවරයෙකුට කරදර වෙන ඕනෑම මොහොතක කොන්දේසි විරහිතව උදවු කරන්න එතුමා ඉදිරිපත් වෙනවා. එවැනි ශ්‍රේෂ්ඨ මන්ත්‍රීවරයෙක්ගේ අභාවය අපිට දරා ගන්න අමාරුයි. එතුමා මේ ජීවිත කාලයේදී කළ පින් අනුව එතුමාට අජරාමර නිවන් සුව ලැබේවායි ප්‍රාර්ථනා කරනවා.

**මහා නගර සභා මන්ත්‍රී - ඩබ්ලිව්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා**

ගරු නගරාධිපතිතුමනි, මොරටුව මහා නගර සභා මන්ත්‍රීවරයෙකු ලෙස දීර්ඝ කාලයක් අප සමග සභාව නියෝජනය කළ ගාවින් මත්තෙස් මහතාගේ අභාවය වෙනුවෙන් ශෝකය පළ කරන මේ අවස්ථාවේදී, මාගේ ජීවිතයේ යම් සුවිශේෂී අවස්ථාවලදී එතුමා මා ළඟින්ම සිටි සහෘදයෙකි. මට මතකයි මගේ දියණිය උපත ලබන්නේ මහා සභාව පැවැත්වෙන දිනයකයි. එදා මම සභාවේ සිටින විට දුරකථන ඇමතුමක් එනවා. ඒ දියණිය උපත ලැබූ බව දැනුම් දීමටයි. ඒ අවස්ථාවේදී මාත් සමග දියණිය බැලීමට ගාවින් මහතාත් රෝහලට යනවා. ඉස්සෙල්ලාම දියණිය දකින්නේ එතුමායි. ඒ තරමටම මට එතුමා සමීපයි. දියණියට නමක් යෝජනා කරන අවස්ථාවේදී ද එතුමා මාවත් රැගෙන අරිසෙන් අහුබුදු ශූරීන් ළඟට යනවා. ඒ අනුව තමයි මගේ දියණියට නම යෝජනා කරන්නේ එම සිද්ධිය මගේ ජීවිතයේ කිසිදා අමතක නොවන සිද්ධියක්. එක්සත් ජාතික පක්ෂය නියෝජනය කළ ගාවින් මත්තෙස් මහතා තම පක්ෂය වෙනුවෙන් ඇපකැපවී කටයුතු කළ මන්ත්‍රීවරයෙක්. එතුමාගේ වියෝවය පිළිබඳ මාගේ පක්ෂය වන ජාතික ජනතා පක්ෂයේත් සංවේගය පලකර සිටිනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අතීත මතක අතර සැරි සරන විට 1997 අතීතයට දිව යනවා. එවකට මා විරුද්ධ පක්ෂය නියෝජනය කිරීම නිසා ගාවින් මත්තෙස් මහතා සහ මා අතර සමීප සම්බන්ධතාවයක් ඇති වෙනවා. මෙතුමා එක්සත් ජාතික පක්ෂයේ ඍජු ප්‍රතිපත්ති නියෝජනය කළ අතර, මා මාගේ පක්ෂය නියෝජනය කළා. එතුමා පක්ෂ පාට බේදයකින් තොරව සියලු මන්ත්‍රීවරුන් අතර කැපීපෙනෙන චරිතයක් වුණා. එතුමාගෙන් උගත හැකි පාඩම් අනන්තයි අප්‍රමාණයි. ගරු නගරාධිපතිතුමනි, සමහර අයගේ නිතරම කටේ පිරිත් තියෙනවා. බුදුරජාණන් වහන්සේටත් වඩා බුදු බණ දන්නවා. නිර්මාංශ අය. ඒ වුණාට හදවතේ කුහකකම් බෙහෝමයි. ඒ අතින් ගාවින් මත්තෙස් මන්ත්‍රීතුමාගේ මනුෂ්‍යාත්වය ඉතාමත් ඉහළයි. මට මතකයි රවිනාත් ගුණසේතර මහතා මුලසුන හොබවන කාලයේ මා ඉතා තදින් සභාවේදී විවාදශීලීව ගැටුණත් සභා ගැබෙන් පිටවන විට අපි සමීපයි. මෑත කාලයේදී මමත්, ගාවින් මත්තෙස් මහතාත් මතවාදී ලෙස සභා සර්භය තුළ විශාල වශයෙන් ගැටුණා, නමුත් ඒවා හිතේ නොරඳවා පසුව සුහදව එතුමා කතා කළා. එවැනි මතක බොහෝමයයි. එතුමා කළ වූ පින් කුසල් හේතුකොට ගෙන අමාමහා නිවන් සුව අත්වේවායි මා නියෝජනය කරන ජාතික නිදහස් පෙරමුණේ නායක ගරු අමාත්‍ය විමල් වීරවංශ මැතිතුමාගේ ශෝකයත් එතුමාගේ පවුලේ උදවියට ප්‍රකාශ කර සිටිනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අප සමග අවුරුදු ගණනාවක් සභාව නියෝජනය කළ ජොෂ්ඨ මන්ත්‍රී ගාවින් මත්තෙස් මහතාගේ අභාවය පිළිබඳව ජනතා විමුක්ති පෙරමුණේ සාතිශය සංවේගය පළ කර සිටිනවා. මේ අවස්ථාවේදී මම කියන්න කැමතියි ගාවින් මත්තෙස් කියන්නේ අප සැම දෙනාටම ආදර්ශයක් ලබා දුන් මන්ත්‍රීවරයක්. තම පක්ෂය වෙනුවෙන් ඇපකැප වී කටයුතු කළ මන්ත්‍රීවරයෙක්. මොන දේශපාලන රැළි ආවත් රාවතාවත්තෙන් ගාවින් මත්තෙස් මැතිතුමා පරද්දන්න කාටත් බැරි වුණා. ඒ තරමටම එතුමා ජනතාවට සමීපයි. මට මතකයි සභාවේ සිදු වූ යම් සිද්ධියකදී අපගේ විරෝධතාවය ප්‍රකාශ කිරීම සඳහා සෙන්කෝළය අතුරුදහන්වීම. මම සෙන්කෝළය අරන් සභාවේ පිටුපස දොරෙන් පිටවුණා. ඒ අවස්ථාවේදී ගාවින් මත්තෙස් මහතා සභා සර්භයේ පිටුපස පිහිටි කාමරයේ සිට එළියට එනවා. එතුමා මාව හොඳින් දැක්කා. මම සෙන්කෝළය අරන් පිටුපස තිබුණු කැබ් රථය තුළට තැන්පත් කළා. පසුව මටවත් හොයා ගන්න බැරි වුණා සෙන්කෝළයට මොකද වුණේ කියලා. සභාවේ සියලුම අය සෙන්කෝළය හොයනවා. ඒ කැබ් රථය කොළඹ ගිහින්. සෙන්කෝළය හම්බ වුණේ නැහැ. ඒත් මම සෙන්කෝළය අරන් ගිය බව කවදාවත් ගාවින් මහත්තයා ප්‍රකාශ කළේ නැහැ. එතුමාට ඕනෑ තරම් අවස්ථා තිබුණා, ඒක කියන්න. ඒත් එතුමා කවදාවත් ඒක කිව්වේ නැහැ. පසුව පොඩි සෙන්කෝළයක් ගෙනැල්ලා සභාව පටන් ගත්තා. එවැනි උගත යුතු පාඩම් එතුමා අපිට කියා දුන්නා. තම ධූර කාලය තුළ තම පක්ෂයට උපරිම පක්ෂපාතීව කටයුතු කළ අතර, ගරු නගරාධිපතිතුමාටත්, සභාව නියෝජනය කරන සියලුම මන්ත්‍රීවරුන්ටත් ඉතාමත් සමීපව කටයුතු කළා.

ගරු නගරාධිපතිතුමනි, අප අතරින් වියෝ වූ ගරු ගාවින් මත්තෙස් මන්ත්‍රීතුමාට අමා මහා නිවන් සුවය ලැබේවායි ප්‍රාර්ථනා කරන අතර, එතුමාට ගෞරවයක් පිණිස මේ සභා සර්භය ''ගාවින් මත්තෙස් අනුස්මරණ ශාලාව'' ලෙස නම් කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. කුමාර රාජරත්න මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මොරටුව මහා නගර සභාවේ දීර්ඝ කාලයක් එක්සත් ජාතික පක්ෂය නියෝජනය කළ ශ්‍රේෂ්ඨයෙකුගේ නික්ම යෑම සනිටුහන් කරන මේ අවස්ථාවේදී අපගේ පක්ෂයේ නායක ගරු උදය ගම්මන්පිල මැතිතුමා ඇතුළු පක්ෂයේ සාතිශය සංවේගය පළ කර සිටිනවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී -බී.සජිත් දුමින්ද පිරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ගාවින් මත්තෙස් මැතිතුමා කියන්නේ දුකේ දී පිහිට වන ශ්‍රේෂ්ඨ චරිතයක්. ඕනෑම අවස්ථාවකදී එතුමා පිහිට වෙනවා. එතුමා නිර්මාණය කරපු බුදු පිළිම වහන්සේ සහ අලි පැටියෙකුගේ නිර්මාණයකුත් දෙනවා. ඒත් ඒක්කම පිරිත් පැන් ලබා දීලා ජීවිතය සාර්ථක කර ගන්න ඒතුමා ඕනෑම පුද්ගලයෙකුට පිහිට වෙනවා. එම නිසා ඒතුමාගේ නික්ම යෑම අපිට දරා ගන්න බැරි ශෝකයක් බවට පත් වෙනවා. ඒවගේම ගරු නගරාධිපතිතුමනි අනිත් පැත්තෙන් ඒතුමා රසකතා පෙට්ටියක්. අප පක්සය නියෝජනය කරන පාඨලී චම්පික රණවක ගරු මැතිතුමාගේ ශෝකය පළ කර සිටිනවා. එතුමාගේ බිරිඳටත්, ආදරණීය දරුවන්ටත් ශෝකය පළ කර සිටිනවා. අවසාන වශයෙන් එතුමාට ජාති-ජරා-මරණ-ව්‍යාධි- තොර අමාමහා නිවනින් සැනසේවා කියා ප්‍රාර්ථනා කරනවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - එච්. ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මොරටුව මහා නගර සභාවේ ඉතාම දීර්ඝ කාලයක් සිටිමින්, අපූර්ව මතකයන් රාශියක් එක්කල පිලිප් ගාවින් මත්තෙස් ගරු මන්ත්‍රීතුමාගේ අභාවය සම්බන්ධව මාගේ පෞද්ගලික ශෝකයත් ඒ වගේම ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණේ ශෝකයත් ගාවින් මත්තෙස් මැතිණියට, දූ-දරුවන්ටත්, මුණුබුරු- මිනිබිරියන්ටත් සියලුම ඥාතිවරුන්ට අපගේ ශෝකය පළ කරන්න මෙය අවස්ථාවක් කර ගන්නවා. පිලිප් ගාවින් මත්තෙස් ගරු මන්ත්‍රීතුමා මම හිතන්නේ එතුමාගේ දේශපාලන ජීවිතය ගත්තත් හරි අපූරුයි. විශිෂ්ඨයි. එතුමාගේ පෞද්ගලික ජීවිතය ගත්තත් ඒ වගේමයි. බොහෝ මනුෂ්‍යාකම් තිබුනු පුද්ගලයෙක් විදියට තමයි ගාවින් මත්තෙස් ගරු මන්ත්‍රිතුමා අපි හඳුනගෙන තිබුනේ. ඒතුමා මේ සභාවේ විපක්ෂයෙ රැදි ඉදගෙන සමහර කරුණු ඉදිරිපත් කරනකොට අපි ඒතුමාට බාධාවන් කරනවා. හැබැයි ඒ බාධාවන් කවදාවත් පෞද්ගලිකත්වයට අරගත්තේ නැහැ. මේ සභා සර්භයේදී ඉවත් කරලා ගියේ.

ඒ වගේම මේ පාලන කාලය ආරම්භ වන වෙලාවේ නගරාධිපති අපේක්ෂකයන් තෝරා ගැනීම තිබුණා. හැබැයි කියනමන් තියෙනවා ගරු නගරාධිපතිතුමනි සෑම සාර්ථක මිනිහෙක්ම අසාර්ථක වෙලා අසාර්ථක මිනිහෙක් සාර්ථක වෙනවා කියලා. ඒ අවස්ථාවේ ගාවින් මත්තෙස් ගරු මන්ත්‍රිතුමා දැනගෙන හිටියා ඒතුමා නගරාධිපති වෙන්නේ නැහැ කියලා හැබැයි ඒ අවස්ථාවට කට්ටිය බය වුණා. නමුත්, එතුමා බය වුනේ නැහැ මම ඉදිරිපත් වෙන්නම් කියලා පක්ෂය වෙනුවෙන් ඉදිරිපත් වෙන්න හයියක් තිබුණා. හැකියාවක් තිබුණා. නිශාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රිතුමා කිව්වා මොන දේශපාලන රැළි ආවත් රාවතාවත්තෙන් ගාවින් මත්තෙස් මැතිතුමා පරද්දන්න බැරි වුණා. රාවතාවත්ත විතරක් නොවෙයි මුලු මොරටුව පුරාවට ගත්තත් සෑම විහාරස්ථානයකටම උදවු කරලා තියෙනවා. විශේෂයෙන්ම මේ වෙලාවේ මතක් කරන්න ඕන එතුමාත් නියෝජනය කරනවා අපිත් නියෝජනය කරනවා මොරටුව ශ්‍රී ලංකා බෞද්ධ සමිතිය ඒ චෛත්‍ය ගොඩනගන කොට ගරු නගරාධිපතිතුමනි ඔබතුමාට මතකයි අපි ඉල්ලීමක් කලා කොත පළන්දන කටයුත්ත සම්බන්ධව. ඒ වෙලාවේ ඔබතුමා එක්ක ඒකතු වෙලා චූඩාමාණික්‍ය අරගෙන ඇවිල්ලා ඒ අවශ්‍ය කටයුතු ඉටු කළා. ඒ වගේ විශාල පිංකම් රාශියක්, යුතුකම් රාශියක් ඉෂ්ඨ කරලා කවදාවත් ඒ වෙනුවෙන් නමක් බලාපොරොත්තු වුණේ නැහැ. ගරු නගරාධිපතිතුමනි, එදා උදෑසන කථා කරලා කිව්වම ගාවින් අයියා නැති වෙලා කියලා. ඒ කියපු අවස්ථාවේ අපිට දැනුන වේදනාව මම හිතනවා අපි කාටත් ඒක දැනෙන්න ඇති කියලා. ගරු නගරාධිපතිතුමනි, අපේ හිතේ රැදුනේ අපිට

මෙපමණ සමීප, අපිට ලෙන්ගතු, එතුමන් වෙනුවෙන් ඒ මධ්‍යම රාත්‍රියේ මගේ අතින් ලියවුනු පද වැල් කීපයක් මම මේ අවස්ථාවේදි ඉදිරිපත් කරනවා. එතුමගේ ජීවිත කාලය තුළ එතුමන් රැස්කර ගත්තාවූ සියලු කුසල් වල බලයෙන් එතුමාට සසර කෙරවල අමා මහා නිර්වාණ ශාන්තිය ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.

ලෝ කුහර තුල හොඳින් රත් කල
රන් රිදී පාටින්ම පිත්තල
අවැසි තරමින්ම හැඩකර
කලාකරුවකි දනන් මත් කල

තමන් සතු මතය දරමින්ම
ඉදුරා වෙනස් මත ඉවසුමට රිසි වූ
මිනිස් වෙස්ගෙන මිනිසුන්ට ලං වූ
මිනිසෙකුය නුඹ බෝසත් ගුණද පෙන්වූ

තැනූ වෙහෙරට
පළඳවා කොත
නම එපා බං කොටන්නට
පිං පොතේ ලියවුනා, ඒ මදැයි
කියූ දවසේයි තේරුනේ නුඹේ හැටි

තබා සමනළ ගිරිසිඛර මත
ඔබේ ලියකම් වලින් හැඩකල
ගිගිම් දෙන ගන්ධාරයේ හඬ..
මුසු වුනා සේ වා තලයටම,
නිහඬ විය. මෙපුර,රන් සීනු හඬ..

ජයම මිස පැරදුමක් නොලැබුව
පුරසබේ ඉපැරණි තැනම ඉසුළුව
තම අතින් තනතුරම බැබළුව
ඔබ කොහිද, ඇත හැම තැනම පාළුව

හිස් කතා බොරු සිනා පාමින්
ඉන්න හැකිමුත් මැති - ඇමති ගාවින්
සිත උපන් මහා ප්‍රේමෙන්
නුඹ වුනේ මිනිසුන්ගෙ ගාවින්

<u>මහා නගර සභා මන්ත්‍රී - කේසර රවින්ද්‍ර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, පිලිප් ගාවින් මත්තෙස් මන්ත්‍රීතුමාගේ ගුණ කථන ඇසූ විට අපිට අද තේරෙනවා එතුමා පක්ෂයක් නියෝජනය කළාට මනුෂ්‍යකම තමයි වැඩියෙන් නියෝජනය කර තියෙන්නේ. එතුමා නායකත්වය දුන්නේ මනුෂ්‍යත්වය වෙනුවෙන්. අදටත් රාවතාවත්ත

කොට්ඨාසය හොල්ලන්න බැරි තත්ත්වයට තියෙන්නේ ඒතුමාගේ හදවත තේරුම් ගත්තු ජනතාවක් ඉන්නේ නිසයි. එතුමාගේ ජීවිත කාලය මන්ත්‍රීධූරය වෙනුවෙන් කැපකරලා කටයුතු කළා. එතුමා පිත්තල ලෝහ කර්මාන්තය තුළින් ලංකාවේ මෙන්ම ලෝකයේ ද නමක් දිනාගත් ශිල්පියෙක්. ඒ සඳහා විශේෂ වූ ගරු සම්මාන ලබා ගෙන තිබෙනවා. ගරු නගරාධිපතිතුමනි, අපි කවුරුත් අදහන බුදු දහමට අනුව අමා මහා නිවස් සුවය ප්‍රාර්ථනා කරන අතර, එතුමා වෙනුවෙන් මා ලියූ කවි වැල් පේළියක් මා ඉදිරිපත් කරනවා.

ලෙංගතුකම් පා නිතරම සිනා මුවින්

දුක සැප බැලුවා කාගෙත් ළඟින් පෙමින්

ආදරය කළා කවුරුත් මැතුඳුට ගාවින්

අතහැර ගිය ද ඔබ සැනෙහේවා නිවනින්

**<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. රවිනාත් ජේ. ගුණසේකර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අපේ විපක්ෂ නායක පී. ගාවින් මත්තෙස් මහතාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කරන මේ අවස්ථාවේදී මම කියන්න කැමතියි, මම එතුමාව හඳුනා ගන්නේ 1971 වර්ෂයේදී. ගාවින් මන්ත්‍රීතුමා ලොකුයි, මම පුංචි කොල්ලෙක්. ඒ දවස්වල ගාවින් මන්ත්‍රීතුමා දක්ෂ ක්‍රිකට් ක්‍රීඩකයෙක්. ඒ කාලවකවානුවේදී අපි ක්‍රිකට් ගහන්නේ එතුමාගේ නිවස ඉදිරිපිට හිස් ඉඩමේ. ඒ කාලයේ රටේ කලබලකාරි අවස්ථාවක පොලීසිය ඇවිල්ලා අපිට සෙල්ලම් කරන්න දුන්නේ නෑ. එවැනි සුන්දර මතක අතීතයේදී අපිට තිබුණා. 2002 වර්ෂයේ පළාත් පාලන ඡන්දය දිනලා මම නගරාධිපති වන විටත්, රාවතාවත්ත නැගෙනහිර කොට්ඨාසයට තේරි පත්වෙන්නේ ගාවින් මන්ත්‍රීතුමා. එතුමා එක්සත් ජාතික පක්ෂයේ සංවිධාන කටයුතු වලදී ඉතාමත් කැපවීමෙන් කටයුතු කළ අයෙක්. ඒ අතරම සැහැල්ලුවෙන් ජීවත් වුණු චරිතයක්. එක් අවස්ථාවක මම නගරාධිපති ලෙස සභා සර්භයට එනවිට මගෙන් අහනවා “බැරිද මටත් චාන්ස් එකක් දෙන්න නගරාධිපති පුටුවේ වාඩි වෙන්න” මම කිව්වා හා පුළුවන්. කොහොම හරි නියෝජ්‍ය නගරාධිපති සභා ගැබෙන් පොඩ්ඩක් එළියට යවලා මම මුලසුනෙන් නැගිටලා එතුමාට නගරාධිපති අසුනේ අසුන් ගන්නට අවස්ථාවක් සලසා දුන්නා. ඒ ක්‍රියාවට එතුමා මට හැම අවස්ථාවකදීම ස්තූති ප්‍රසංසා කළා. එවැනි හෘදයාංගම චරිතයක් වූ ගාවින් මත්තෙස් මන්ත්‍රීතුමාගේ අභාවය අපට දැරිය නොහැකි ශෝකයක්. එතුමා නිර්මාණශීලි පුද්ගලයෙක්. ශ්‍රී ලංකා තිලක වැනි ජාතික සම්මාන වලින් පිදුම් ලැබූ චරිතයක්. එතුමාගේ ආදරණීමය බිරිඳවන ලක්ෂ්මි මත්තෙස් මහත්මියටත්, බුද්ධික මත්තෙස් පුතුණුවන්ටත්, දියණියන් දෙදෙනාටත්, මාගේ සාතිශය සංවේගය මේ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටිනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ගරු ගාවින් මත්තෙස් මන්ත්‍රීතුමා මගේ පියාත් සමඟ දේශපාලනයේ නියැලිලා 1968 ඒක්සත් ජාතික පක්ෂයේ දේශපාලනට පිවිසිලා අවුරුදු 20 ක තරුණයෙක් හැටියට රාවතාවත්ත ප්‍රදේශයේ පාර්ලිමේන්තු මන්ත්‍රී රස්කින් ප්‍රනාන්දු මැතිතුමාගේ නායකත්වයෙන් ඒක්සත් ජාතික පක්ෂ දේශපාලනයට අත්පොත් තබනකොට එදා සිට දේශපාලනයට කරදීලා, උරදීලා සැහෙන වෙහෙසක් දරලා රාවතාවත්ත කොට්ඨාසයේ 82 වර්ෂයේ සිට කටයුතු කළා. ගරු ටිරෝන් ප්‍රනාන්දු ඇමතිතුමාට සෙවනැල්ලක් වගේ දේශපාලනයේ යෙදිලා ඒ ලබාදුන් දායකත්වය නිසාවෙන්ම ඒ වගේම රාවතාවත්ත කොට්ඨාසයේ සමිති සමාගම් පිහිටුවලා බෞද්ධ මධ්‍යස්ථාන වල තමන්ගේ ශ්‍රමය, තමන්ගේ මුදල් විශාල ප්‍රමාණයක් වියදම් කරමින් කටයුතු කළා. ඒ හේතුන් නිසාම ටිරෝන් ප්‍රනාන්දු මැතිතුමා මට

මතකයි නගර සභා මැතිවරණයට රාවතාවත්ත නැගෙනහිරින් අවස්ථාව ලබා දුන්නා. ඉන් පසු ගෙයක් ගෙයක් පාසා ගිහිල්ලා හැමෝගෙම හිත දිනාගෙන එතුමාගේ කොට්ඨාසයේ වැඩ කළා.එවැනි ශ්‍රේෂ්ඨ මන්ත්‍රී තුමාට අමාමහා නිවන් සුව අත්වේවායි ප්‍රාර්ථනා කරනවා.

**<u>නියෝජ්‍ය නගරාධිපති - ඩී. සමන්ත සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, දීර්ඝ කාලයක් අප සභාව නියෝජනය කළ විපක්ෂ නායක පී. ගාවින් මත්තෙස් මහතා ඉතාමක් කුළුපග මිත්‍රශීලි මහත්මයෙක්. මන්ත්‍රීවරුන් ප්‍රකාශ කළ පරිදිම මා හටද එතුමා දුන් පිළිමය මේ දක්වා මා සන්තකයේ තිබෙනවා. එවැනි මතක සදා අමරණීයයි. එතුමාට ශෝකය පළ කරන මේ අවස්ථාවේදී, එතුමාගේ පවුලේ සියලු දෙනාටත්, දරුවන්ටත් මාගේ ශෝකය පළ කරන අතර, එතුමාට අමාමහා නිවන් සුව අත්වේවායි ප්‍රාර්ථනා කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජේ ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන අපගේ විපක්ෂ නායක ගාවින් මත්තෙස් මැතිතුමාගේ අභාවය පිළිබඳව මාගේ ශෝකය පළ කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. සුදර්ශනී ප්‍රියන්තිකා කුරේ මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමා, විපක්ෂ නායක ගාවින් මත්තෙස් මන්ත්‍රීතුමාගේ අභාවය පිළිබඳව මාගේ ශෝකය මේ අවස්ථාවේදී පළ කර සිටිනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමා, 1997 වර්ෂයේ සිට එක්සත් ජාතික පක්ෂය නියෝජනය කළ මහා නගර සභා මන්ත්‍රී, විපක්ෂ නායක ගාවින් මත්තෙස් මන්ත්‍රීතුමාගේ අභාවය පිළිබඳව මාගේ ශෝකය මේ අවස්ථාවේදී පළ කර සිටිනවා.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිවරුනි, දීර්ඝ කාලයක් මහා නගර සභා මන්ත්‍රීවරයෙක් ලෙස කටයුතු කල පී. ගාවින් මත්තෙස් මන්ත්‍රීතුමාගේ අභාවය වෙනුවෙන් ශෝක යෝජනා අවස්ථාවේදී , සියලු දෙනාම කථා කරනවාට වඩා ගෞරවනීය ලෙස පක්ෂ නියෝජනය කරමින්, ප්‍රදේශය නියෝජනය කරමින් එතුමා පිළිබද ගුණ කථන කළ සියලුම මන්ත්‍රීවරුන්ට ගෞරවනීය ස්තුතිය පුද සිටිනවා. මේ අවස්ථාවේදී, එතුමා තම ජීවිත කාලය තුල රැස්කරගත්තා වූ පින් කුසල් හේතුවෙන් අජරාමර නිවන් සුව අත්වේවායයි මා ප්‍රාර්ථනා කරනවා.

අංක 05 (01) දරණ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

ගරු කොමසාරිස්තුමනි, එතුමාගේ ශෝක යෝජනාව එතුමාගේ පවුලේ අය වෙත යොමු කරන ලෙස ද දන්වා සිටිනවා.

## 06. <u>2021 සැප්තැම්බර් මස ස්ථාවර කමිටු වාර්තා සළකා බැලීම.</u>

06(1) 2021.09.21 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ / ඉඩම් හා නගර සංවර්ධන පිළිබඳ / මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධන පිළිබඳ / පරිසර, සෞඛ්‍ය සනිපාරක්ෂාව පිළිබඳ / ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ, කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ / ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ / ඵලදායීතාව හා මුදල් උත්පාදන පිළිබඳ / මුදල් පිළිබඳ වූ විශේෂ ඒකාබද්ධ ස්ථාවාර කමිටු වාර්තාව සළකා බැලීම.

2021.08.11 දින පැවති පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තීරණ අංක 2(5) සහ 2021.06.13 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තීරණ අංක 20 ට අදාළව 2021.09.16 දින මහා සභා රැස්වීමේදී පරිදි මොරටුව මහා නගර සභා ප්‍රදේශය තුළ එක්රැස් වන අපද්‍රව්‍ය කරදියාන කසළ අංගනයට බැහැර කිරීමට අදාළව බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය සමඟ ගිවිසුම්ගතවීම සම්බන්ධව 2021.09.21 දින පැවති විශේෂ ඒකාබද්ධ ස්ථාවර කමිටු වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

06(2) 2021.09.21 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තීරණයන් සළකා බැලීම.

2021.09.21 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම තීරණයන්ට පක්ෂව සියලුම මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.

| | | | |
|---|---|---|---|
| 01. | නගරාධිපති | - | ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 02. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 05. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 06. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 07. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 08. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා |
| 09. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ලලිත් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එෆ්.බී.නිලංක සිල්වා මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කුමාර රාජරත්න මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.පිලිප් ෆ්‍රැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.උජිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.දීපා චාන්දනී ආරියවංශ මහත්මිය |

2021.09.21 දිනැති මුදල් කමිටු වාර්තාවේ අංක 03, අංක 09, අංක 12, අංක 15 විරුද්ධවත්, අංක 13 කරුණට නිහඬවත්, අනෙකුත් සියලුම කමිටු තීරණයන්ට පක්ෂවත්, පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.

| | | | |
|---|---|---|---|
| 01. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා |
| 02. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 05. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 06. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය |
| 07. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.ක්‍රිෂනි ප්‍රනාන්දු මහත්මිය |

2021.09.21 දිනැති මුදල් කමිටු වාර්තාවේ අංක 03, අංක 09, අංක 12, අංක 13, අංක 15 විරුද්ධවත්, අනෙකුත් සියලුම කමිටු තීරණයන්ට පක්ෂවත්, පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.

| | | | |
|---|---|---|---|
| 01. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 02. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුදර්ශනි ප්‍රියන්ත්‍රිකා කුරේ මහත්මිය |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |

2021.09.21 දිනැති මුදල් කමිටු වාර්තාවේ අංක 03, අංක 04, අංක 05, අංක 09, අංක 15 විරුද්ධවත්, අනෙකුත් සියලුම කමිටු තීරණයන්ට පක්ෂවත්, පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.

| | | | |
|---|---|---|---|
| 01. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 02. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |

2021.09.21 දිනැති මුදල් කමිටු වාර්තාවේ සියළුම කමිටු තීරණ වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

(මෙම අවස්ථාවේ පහත නම් සදහන් මන්ත්‍රීවරුන් සභා ගැබෙහි නොසිටියහ.

| | | | |
|---|---|---|---|
| 01. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.මැක්සි ජේ ප්‍රනාන්දු මහතා |
| 02. | මහා නගර සභා මන්ත්‍රී | - | සුනිල් නන්දසිරි මාසකෝරාල මහතා |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා) |

**07.** **<u>ලැබීම් ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශ වැඩ ප්‍රගති වාර්තාව</u>**

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි,2021.09.21 දිනැති මුදල් කමිටු වාර්තාවේ අංක 04 යටතේ 2021 අගෝස්තු මාසයට අදාල මූල්‍ය වාර්තාව ඇමුණුම 01 ලෙස ඉදිරිපත් කර ඇත.

**08.** **<u>පුද්ගලික ස්භාවයේ කරුණු</u>** **-** නැත

**09.** **<u>වෙනත් කරුණු</u>** - නැත.

සභාවේ වැඩ කටයුතු මෙතනින් අවසන් විය.

අ.කලේ/ ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු
නගරාධිපති,
මොරටුව මහා නගර සභාව,
මොරටුව.

2021.10.07 දින,
මොරටුව මහා නගර සභා කාර්යාලයේදිය.